# සීතාවක ප්‍රාදේශීය සභාව

## 2018 වර්ෂයට අදාලව අක්කර බදු පැනවීම

සීතාවක ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටුකරන, සීතාවක ප්‍රාදේශීය සභාවේ ලේකම් කේ.ඒ. චන්දන පද්මසිරි වන මම1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 134 වැනි වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව සීතාවක ප්‍රාදේශීය සභා සීමාව ඇතුලත පිහිටියා වූද,ස්ථිර හෝ නිතිපතා ගොවිතැනක් යටතේ වූහෙක්ටයාර් පහක් හෝ ඊට වැඩිවන සෑම හෙක්ටයාරයක් මතම 2018 වර්ෂය සඳහා රුපියල් 10.00 බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කළ යුතු බවට2017 /10/12 දින අංක 9262 යටතේ තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

2017/ 10/12 දින,
සීතාවක ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේදී,

කේ.ඒ.චන්දන පද්මසිරි,
ලේකම් හා බලතල,කාර්ය,කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
සීතාවක ප්‍රාදේශීය සභාව,
හංවැල්ල.

තීරණය

තවද, 2018 වර්ෂයෙහි පහත උප ලේඛනයේ සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන වාර්ෂික අක්කර බද්ද ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික අක්කර බද්ද එම වර්ෂයෙහි ජනවාරි 31වන දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික අක්කර බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10 %) ක වට්ටමක්ද, එකී උප ලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියෙන් තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාල අක්කර බදු මුදල ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එක් කාර්තුවට අදාල මුදලින් 5 % ක වට්ටමක්ද ප්‍රාදේශීය සභාව ලබාදිය යුතු බවටත් තීරණය කරමි.

ඉහත කී උපලේඛණය

| 1 තීරුව | 11 තීරුව | 111 තීරුව |
|---|---|---|
| කාර්තුව | ගෙවිය යුතු දිනය | 5% වට්ටම සඳහා හිමිකම ලබන අවසාන දිනය |
| පළමුවන කාර්තුව | 2018 මාර්තු 31 | 2018-ජනවාරි 31 |
| දෙවන කාර්තුව | 2018 ජුනි 30 | 2018අප්‍රේල් 30 |
| තුන්වන කාර්තුව | 2018 සැප්තැම්බර් 30 | 2018 ජූලි 31 |
| හතරවන කාර්තුව | 2018 දෙසැම්බර් 31 | 2018 ඔක්තොම්බර්31 |

සිංහල, දෙමළ හා ඉංග්‍රිසි මාධ්‍යය වලින් පළ කරනු ලබන මෙම දැන්වීමෙහි එක් එක් භාෂා වලින් පළ කිරීමේදී යම් නොගැලපීමක් ඇතිවුවහොත් සිංහල මාධ්‍යයෙන් පළ කරන ලද දැන්වීම බලාත්මක වේ.